රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## (SLIDA)

## *පුරප්පාඩු*

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) යනු *ඉගෙනුම සහ සංවර්ධනය, කළමනාකරණ උපදේශන සේවා සහ පර්යේෂණ හරහා ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ධාරිතාව ගොඩ නැංවීම සම්බන්ධයෙන් වගකිව යුතු ප්‍රමුඛ රාජ්‍ය ආයතනයයි.*

**පහත සඳහන් පුරප්පාඩු ස්ථිර පදනම යටතේ පහත සුදුසුකම් වලින් සමන්විත තැනැත්තන්ගෙන් සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) බලාපොරොත්තු වේ.**

| තනතුර | අවශ්‍ය සුදුසුකම් | වැටුප් පරිමාණය |
|---|---|---|
| කළමනාකරණ සහකාර | අධ්‍යාපන සුදුසුකම්<br>• පහත විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ. පො. ස. (සා / පෙළ) විභාගයේ විෂයයන් හයකින් එකවර සමත් වීම<br>I. සිංහල / දෙමළ<br>II. ගණිතය<br>III. ඉංග්‍රීසි භාෂාව<br><br>සහ<br><br>• අ. පො. ස. (උ/පෙළ) විභාගය විෂයයන් තුනකින් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)<br><br>වයස් සීමාව අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. | එම්ඒ 1-1-2016 27,910 – 300 X 10 – 350 X 7 – 495 X 4 – 660 X 20 – 48,540 |

තනතුර සඳහා තෝරා ගැනීම, තරඟකාරී ලිඛිත විභාගයේ ප්‍රතිඵල සහ පත්කිරීම් බලධරයා විසින් පත් කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම්ව සිදු කෙරෙනු ඇත.

ලිඛිත තරඟ විභාගය :

විභාගය සඳහා අදාළ වන විෂයයන් පහත දැක්වේ.

- අභියෝග්‍යතා පරීක්ෂණය සහ සාමාන්‍ය දැනීම
- භාෂා ප්‍රවීණතාවය
  (මෙහිදී අපේක්ෂකයා සේවයට බැඳීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය පරීක්ෂා කරනු ලැබේ. එහිදී, ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සම සාමාන්‍ය ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු කෙරෙහි අපේක්ෂකයාගේ කුසලතාව මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි)

- පරිගණක පරීක්ෂණය

බඳවා ගැනීමේ විභාගය සමත් වීම සඳහා අපේක්ෂකයන් විසින් එක් එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ද, විෂයයන් තුන සඳහා එකතුව අවම වශයෙන් 50% ක් ද ලබා ගත යුතුය.

සම්මුඛ පරීක්ෂණය :

සම්මුඛ පරීක්ෂණය සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| • අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 35 |
| • අදාළ අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 35 |
| අනෙකුත් කුසලතා / කාර්යය සාධනයන් | - | ලකුණු 20 |
| • සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | - | ලකුණු 10 |
| | | ------------ |
| | | ලකුණු 100 |
| | | ======== |

පොදු කරුණු :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්පත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන (SLIDA) වෙබ් අඩවියෙන් (www.slida.lk) වෙතින් බා ගත කළ හැකිය.
- තරඟ විභාගය සඳහා විභාග ගාස්තුව එක් අයදුම්පතක් සඳහා රු. 1000 / - කි.
- විභාග ගාස්තු ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ගිණුම් අංකය 2323278 වෙත බැර වන ලෙස ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවිය යුතුය.
- මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ මුල් පිටපත අයදුම් පත්‍රයේ දක්වා ඇති කොටුව තුළ අලවන්න.
- අයදුම් පත්‍රය අදාළ සහතිකවල පිටපත් සමඟ "අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07" යන ලිපිනයට 02.04.2018 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.
- ලියුම් කවරයෙහි ඉහළ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කළ තනතුර සඳහන් කළ යුතුය.
- අදාළ විස්තර සහ සහතිකවල ඡායා පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- කුමන අයුරකින් හෝ බලපෑමක් සිදු කිරීම තනතුරට පත්වීම සඳහා නුසුදුසුකමක් වනු ඇත.

---

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
28/10 මලලසේකර මාවත
කොළඹ 07
දුරකතන : 94 11 5980200 ෆැක්ස් : 94 11 2584406 විද්‍යුත් තැපෑල : slida.lk